බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
External Degrees and Extension Courses Unit
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
University of Sri Jayewardenepura

මගේ අංකය / My Number – USJP/EEX/03/2024
ඔබේ අංකය / Your Number –
දුරකථනය / Telephone – 011-2801481,011-3132496, 011-5929791
ෆැක්ස් / Fax – 011-2802753
ලිපිනය / Address – තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල නුගේගොඩ, ශ්‍රී ලංකා / Post Box 10,Gangodawila Nugegoda, Sri Lanka,
වෙබ්අඩවිය / Website – www.external.sjp.ac.lk
විද්‍යුත් තැපැල / E-mail – info.ext@sjp.ac.lk

2024-03-28

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

## 2020 සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම - 2024

**01. පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට හා පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වමි.**

| | |
|---|---|
| පරීක්ෂණ අයදුම්පත සහ පරීක්ෂණ ගාස්තු ගෙවිය යුතු ගිණුම් අංකය | www.external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස ඉහත ශීර්ෂය යටතේ ඇති වෙබ් පිටුවේ ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය " v"අකුර රහිතව යෙදීමෙන් බාගත (Download) කර ගත හැක. |
| <u>පරීක්ෂණ ගාස්තු</u> | රු. 10,000/- |
| අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය (පළමුව exams.edecu@sjp.ac.lk විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර, පසුව තැපෑලට යොමු කළ යුතුය.) | සහකාර ලේඛකාධිකාරී, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය, තැපැල් පෙට්ටිය අංක 10, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට **<u>ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.</u>** |
| අයදුම්පත් භාරගන්නා අවසාන දිනය | **2024/04/25** |

**02. සැලකිය යුතුයි**

I. ඉහත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා **<u>ඔබ විසින් පාඨමාලා ගාස්තු දෙවන වාරිකය හා තෙවන වාරිකය සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ. දෙවන සහ තෙවන වාරිකය ගෙවීම සඳහා අයදුම්පත්‍ර වෙබ් අඩවියේ පළ කර ඇත.</u>**

II. අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2024/04/25 වන අතර එම දිනයෙන් පසුව කිසිඳු හේතුවක් මත අයදුම්පත් භාර ගනු නොලැබේ.

III. පරීක්ෂණ ගාස්තු ගෙවීම සඳහා එක් අයදුම්කරුවකු වෙනුවෙන් සුවිශේෂී ගිණුම් අංකයක් බැගින් ඇති අතර අදාළ ගිණුම් අංකයට පමණක් ගෙවීම් කළ යුතුය. **(එහි ඡායාපිටපතක් ළඟ තබාගත යුතු අතර වෙනත් ගිණුම් අංකවලට ගෙවන ලද මුදල් පිළිබඳ විශ්වවිද්‍යාලය වග කියනු නොලැබේ.)**

IV. නියමිත පරිදි මුදල් නොගෙවන ලද, අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

V. 2020 සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි III පරීක්ෂණය විභාග කාල සටහන http://external.sjp.ac.lk/bachelor-of-social-sciences-in-environmental-and-development-studies-general-external-degree-exam-timetables/ යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පල කරන අතර සියළු දැනුවත් කිරීම් වෙබ් අඩවිය හරහා පමණක් සිදුකරන බැවින් නිරතුරුවම වෙබ් අඩවිය පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය වේ.

VI. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පෙනී සිටිය හැක. ඒ සඳහා වන විස්තර http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/ යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VII. මෙම පරීක්ෂණය සඳහා ඉල්ලුම් කළ අපේක්ෂකයන්ට පමණක් පහත විස්තර වලට අනුකූල වන පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ හැකිය. මෙම පරීක්ෂණයට අයදුම් නොකර වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීම වලංගු නොවේ. නියමිත පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර ප්‍රතිඵල නිකුත් කිරීමේදී වෛද්‍ය වාර්තා අනුමත වුවද (ප්‍රතිඵල ලේඛනයේ MC ලැබුණු ද) ඉදිරි පරීක්ෂණය සඳහා අදාල විභාග ගාස්තු ගෙවීම අනිවාර්ය වේ.

VIII. නියමිත දිනට ඉහත පරීක්ෂණය සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර ඉදිරිපත් කළ සිසුන්ගේ විභාග ප්‍රවේශ පත්‍ර http://external.sjp.ac.lk/bachelor-of-social-sciences-in-environmental-and-development-studies-general-external-degree-exam-admissions/ වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුලත් කිරීමෙන් ලබාගත හැකි අතර විභාග ප්‍රවේශපත් තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න. (සියලු දැනුවත් කිරීම් කෙටි පණිවිඩ මඟින් සිදුකරන බැවින් නිවැරදි දුරකථන අංකයක් ලබා දීම අත්‍යවශ්‍ය වේ.)

IX. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 09/2021 අනුව ඔබට අදාල උපාධි සහතිකය සහ විස්තරාත්මක ප්‍රතිඵල ලේඛනය නිකුත් කරනුයේ ඔබ විසින් බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමේදී ඉදිරිපත් කරන ලද උප්පැන්න සහතිකයේ සඳහන් නමට පමණි. ඒ අනුව පහත දක්වා ඇති අයදුම් පත්‍ර අංක 01 නිවැරදිව සම්පූර්ණ කර උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපතක් සමඟ එවිය යුතුවේ.

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ**

**292 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු**

**බාහිර අපේක්ෂකයන් සඳහා**

7.4 අසනීප නිසා මුළු විභාගයටම හෝ විභාගයේ කොටසකට පෙනී නොසිටි/ නොසිටින බාහිර විභාග අපේක්ෂකයන් ඒ බව විභාග ආරම්භ වීමට ප්‍රථම හෝ විභාග පැවැත්වෙන කාල සීමාව තුළ හෝ රජයේ ආරෝග්‍ය ශාලාවකින් වෛද්‍ය සහතිකයක් නියෝජ්‍ය ලේඛකාධිකාරී හෝ සහකාර ලේඛකාධිකාරී/ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය වෙත ඉදිරිපත් කළ යුතුය.

7.5 නොවැලැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් අදාල විභාගය හෝ විභාගයේ කොටස පැවැත්වීමට නියමිත දින සිට දින 14 ක් ඇතුළත ඉදිරිපත් කළයුතු ය. පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික පිළිගනු නොලැබේ.



සහකාර ලේඛකාධිකාරි
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2024.03.28